# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2082/53 – 2018 අගෝස්තු 02 වැනි බ්‍රහස්පතින්දා – 2018.08.02**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/21/05/2013.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත 4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2016.04.07 වැනි දින අංක 1961/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2016.04.05 වැනි දින දරන නියෝගයෙන්,

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම. (චමින්ද ස්ටවුටර් මහතා වෙනුවෙන්)

*සහ*

එවරි ඩෙනිසන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 2 වන අදියර, ආයෝජන ප්‍රවර්ධන කලාපය, බියගම.

අතර පවත්නා 2016.02.10 වැනි දින කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳ වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. එම්. එස්. ජයවර්ධන මහතා වෙත යොමු කරන ලදී.


1A – G 28214 – 17 (2018/08)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2016.04.05 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

08 - 614/1

*මගේ අංකය* : IR/21/05/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4 (1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම. (චමින්ද ස්ටවුටර් මහතා වෙනුවෙන්)

*සහ*

එවරි ඩෙනිසන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 2 වන අදියර, ආයෝජන ප්‍රවර්ධන කලාපය, බියගම.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රත්මලාන, සිරිමල්උයන, අරලිය මාවත, නො. 03, ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය* : IR/21/05/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම. (චමින්ද ස්ටවුටර් මහාත වෙනුවෙන්)

*සහ*

එවරි ඩෙනිසන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 2 වන අදියර, ආයෝජන ප්‍රවර්ධන කලාපය, බියගම.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

" බියගම, ආයෝජන ප්‍රවර්ධන කලාපයේ, 2 වන අදියරේ පිහිටි එවරි ඩෙනිසන් ආයතනය විසින් 2011 වසරේදී සේවකයන් වෙනුවෙන් කරන ලද කාර්ය සාධන ඇගයීමේදී චමින්ද ස්ටවුටර් නැමැති සේවකයාට අගතියක් සිදු කර ඇති බව සඳහන් කරමින් අන්තර්

සමාගම් සේවක සංගමය විසින් කර ඇති ඉල්ලීම යුක්ති සහගත ද, එසේ යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමි වියයුතු සහනය කවරේද යන්න පිළිබඳව වේ.”

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජූලි මස 16 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 - 614/2

---

මගේ අංකයඃ IR/COM/03/2016/143.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්*

සීතා විජේසූරිය මිය, ‘‘ශාන්ති’’, තලාවිටිය, පරකඩුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මාතලේ, මෙල්පිටිය, අංක 75, එස්. කාරියවසම් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකයඃ IR/COM/03/2016/143.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්*

සීතා විජේසූරිය මිය, ‘‘ශාන්ති’’, තලාවිටිය, පරකඩුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

‘‘රාජ්‍ය මැණික් සංස්ථාවේ සේවය කළ සීතා විජේසූරිය මිය 1994 වර්ෂයේ එම සංස්ථාව, අධිකාරියක් බවට පත් කිරීමේ දී අතිරික්ත සේවිකාවක් වශයෙන් සලකා නියමිත වයස එළඹෙන්නට ප්‍රථම පොදු වන්දි ක්‍රමය යටතේ සිය කැමැත්තෙන් සේවයෙන් ඉවත් වීමට කැමැත්ත ප්‍රකාශ කිරීම මත ගෙවිය යුතු

වන්දි ප්‍රමාණය ගණනය කිරීමට බුළුමුල්ල වන්දි ක්‍රමය, උපයෝගි කර ගැනීමෙන් යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජුලි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 - 615

---

මගේ අංකය: IR/COM/04/2017/14.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්*

එන්. සී. එස්. පී. මෙන්ඩිස් මයා, පුරාණගම, කොට්ටුකච්චිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මැණික්දිවෙල, ශ්‍රී ජේමරතන මාවත, අංක 22/1, එස්. ජී. සූරියආරච්චි මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජුලි මස 16 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2017/14.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්*

එන්. සී. එස්. පී. මෙන්ඩිස් මයා, පුරාණගම, කොට්ටුකච්චිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක. 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පුත්තලම ඩිපෝවේ IV වන ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙස සේවය කළ එන්. සී. එස්. පී. මෙන්ඩිස් මහතා හට වයස අවුරුදු 55ට පසුව සේවා දිගුවක් ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස්. ජනරාල්.

2018 ජුලි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 - 616